සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 10 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය

නම / විභාග අංකය :-............................................................... කාලය: පැය 03 යි

**එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති ප්‍රකාශය කියවා නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඔබට සපයා දී ඇති කොටු කඩදාසියේ අදාළ ප්‍රශ්න අංකයට ඉදිරියෙන් කොටුව තුළ (x) සටහන් කරන්න.**

01. සාර්ථක ශිෂ්‍ය ජීවිතයක් සඳහා පදනම සකස් කර ගැනීමට බුදු සිරිතේ පහත සිදුවීම් අතුරෙන් ශිෂ්‍යයෙකුට වඩාත් වැදගත්ම කරුණ වන්නේ,
    (1) උපත සිදුවූ විගස පියවර තැබීම.
    (2) සත් පියුම් මත වැඩ සිටීම
    (3) උපත සඳහා පසුබිම නුවණින් විමසා බැලීම
    (4) සිංහ නාද පැවැත්වීම.

02. සිදුහත් බෝසතාණෝ විවාහ කරගත් භද්දකච්චානා කුමරියගේ පියා වූයේ,
    (1) බිම්බිසාර රජතුමාය. (2) සුප්‍රබුද්ධ රජතුමාය.
    (3) උදේනි රජතුමාය. (4) කොසොල් රජතුමාය.

03. බෝසත් චරිතය පුරාවටම දක්නට ලැබුණු සුවිශේෂී ලක්ෂණයක් ලෙස ගත හැක්කේ,
    (1) සෑම විටම පියරජතුමාගේ අපේක්ෂාව ඉටුකිරීමට උනන්දු වීම.
    (2) දිගු කාලයක රජ සැප විඳිමින් පහසු ජීවිතයක් ගත කිරීමට සිතීම.
    (3) සියළු කරුණු නිවැරදිව මැනවින් ඉටු කිරීම.
    (4) අන් අය තලා පෙළා හෝ තම අරමුණ වූ විමුක්තිය සෙවීමට යොමු වීම.ද

04. සිදුහත් බෝසතාණෝ සියළු ලෝ සතුන් දුකින් මුදවා ගැනීමට කළ නිවැරදි ක්‍රියා මාර්ගය වූයේ,
    (1) සය අවුරුදු දුෂ්කර ක්‍රියාවයි. (2) පැවිදි බිමට පැමිණීමයි.
    (3) නිවන් මග සොයා ගැනීමයි. (4) රජ සැප අත් හැරීමයි.

05. බුද්ධ, ධම්ම, සංඝ, යන ත්‍රිවිධ රත්න ලොව පහල වූ පෝය දින වන්නේ, පිළිවෙලින්,
    (1) වෙසක් පෝය, පොසොන් පෝය, ඇසළ පෝය.
    (2) වෙසක් පෝය, වෙසක් පෝය, ඇසළ පෝය.
    (3) පොසොන් පෝය, ඇසළ පෝය, දුරුතු පෝය.
    (4) පොසොන් පෝය, පොසොන් පෝය, ඇසළ පෝය.

06. ගිහි ජීවිතයක් ගත කරන ගිහියාට අයත් ශීලය ලෙස හඳුන් වන්නේ,
    (1) අටසිල් (2) ආජීව අෂ්ටමක සිල් (3) පන්සිල (4) දසසිල්

07. සිතෙහි නිදිබර ගතිය හා සිතෙහි තරහව උපමා කර ඇති නීවරණ ධර්ම පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) ව්‍යාපාදය හා ථීන මිද්ධයයි. (2) ථීනමිද්ධය හා ව්‍යාපාදයයි.

(3) ව්‍යාපාදය හා විචිකිච්ඡාවයි. (4) විචිකිච්ඡාව හා කාමච්ඡන්දයයි.

08. සිත දියුණු කිරීමේ පදනම වන්නේ,

(1) හිරි ඔත්තප්පයයි (2) ප්‍රඥාවයි (3) ශීලයයි (4) ව්‍යායාමයයි.

09. ලොව පැරණිම සමාජ සංවිධානය වූ භික්ෂු සංවිධානයේ ආරම්භක පුරෝගාමීහු නම්,

(1) තුන්බෑජටිලයන්ය. (2) භද්‍රවග්ගිය කුමාරවරුය.

(3) යසකුල පුතු හා යහළුවන්ය. (4) පස්වග තවුසන්ය.

10. මහා සංඝ රත්නයෙන් ඉටුවන සමාජ මෙහෙවර හා අදාළ නොවන්නේ,

(1) ගර්භනී මාතාවන්ට ආශිර්වාද පිණිස අංගුලිමාල පිරිත දේශනා කිරීම.

(2) රෝගාබාධ බහුල කාලවල දී රතන සූත්‍රය දේශනා කිරීම.

(3) ප්‍රදේශයේ ගරා වැටුණු වෙහෙර විහාරස්ථාන ප්‍රතිසංස්කරණයට වෙහෙසීම.

(4) සැදැහැවතුන්ගෙන් ප්‍රත්‍ය පහසුකම් කෙසේ හෝ ලබාගැනීම.

11. පුද්ගලයා පාප ක්‍රියා සඳහා සිත යොමු කරන දුර්වලතා තුන වන්නේ,

(1) සිත,කය,වචනය (2) ශීල,සමාධි,ප්‍රඥා

(3) ලෝභය,ද්වේශය,මෝහය (4) කාම,භව,විභව

12. භාවනා කිරීම සඳහා යොදා ගතහැකි ඉරියව්වක් නොවේ,

(1) සක්මන් කිරීම. (2) වාඩිවී සිටීම. (3) දිවීම. (4) වැතිර සිටීම.

13. එක් දිනක මධ්‍යම රාත්‍රියේ එක්තරා දෙවියෙක් ජේතවනාරාමයට පැමිණි අතර එම දෙව් තෙමේ බුදුරජාණන් වහන්සේගෙන් මෙසේ විමසීය."ගෞතමයාණන් වහන්ස, ඇතුලත අවුල්ය, පිටතද අවුල්ය. සත්ත්ව ප්‍රජාව අවුලෙන් වෙලී සිටිති.කවරෙක් මේ අවුල් නිරවුල් කරන්නේද?" මෙම ආරවුල විසඳීම සඳහා බුදු රජාණන් වහන්සේ දුන් අවවාදය වන්නේ,

(1) ශක්‍ර දෙවේන්ද්‍රයාගෙන් විමසන ලෙසය.

(2) මෙම ප්‍රශ්නයට පිළිතුරුදීම ඵල රහිත බවය.

(3) සීලයෙහි පිහිටා සමාධිය හා ප්‍රඥාව වඩන ලෙසය.

(4) දුෂ්කර ව්‍රත සමාදන් වන ලෙසය.

14. සමථ භාවනාවෙන් සිදු කෙරෙන්නේ,

(1) නිවන් ලබා දීමයි. (2) කෙලෙස් ප්‍රහීන කිරීමයි.

(3) කෙලෙස් යටපත් කිරීමයි. (4) සසර දුක් නැති කිරීමයි.

15. බුදු දහම අනුව පුද්ගලයා සතර මහා භූත රූප කොටස් වලින් නිර්මාණය වී ඇතැයි පිළිගනී. එහි "පඨවි" යනු

(1) තද ගතියයි. (2) ද්‍රව ගතියයි. (3) උෟෂ්ණ, ශීතල ගතියයි. (4) සෙලවෙන ගතියයි.

16. තිලකුණු පිළිබඳ මනා අවබෝධයකින් යුක්ත තැනැත්තා,

(1) අසීමිත ආශාවන් වලින් යුක්ත වේ. (2) අසීමිතව පස්කම් සුව විඳියි.

(3) කුසීතව ජීවත් වෙයි. (4) අටලෝ දහමින් නොසැලෙයි.

17. "මා තරුණවියේ පිළිවෙත් රැක්කේ ද නැත. ධනය රැස් කළේ ද නැත. දැන් මහලු වූ යෙමි. ඒ කිසිවක් කරන්නට ශක්තියක්ද නැත්තේ වෙමි" යමෙකුට මෙසේ නොසිතෙන්න කළ යුත්තේ,

(1) තරුණ වියේදී කෙළිදෙලෙන් සිටීම

(2) මහලු වියේ බණ භාවනා වැඩීම

(3) බාල, තරුණ, මහලු යන අවධි තුන කළමනාකරණය කර ගැනීම

(4) කයෙන් වචනයෙන් අපිරිසිදු ක්‍රියා සිදු කිරීම

18. දමනය වීම, හික්මීම, සංවරය, සංයත බව, යන ගුණ ධර්මය හා ගැළපෙන වචනය වන්නේ,

(1) සතිමතෝ යන්නයි. (2) සුචිකම්ම යන්නයි. (3) ධම්මජීවී යන්නයි. (4) සඤ්ඤත යන්නයි.

19. බුදු රජාණන් වහන්සේ ජීවමාන කාලයේ සිටි මහධන සිටු පුත්‍රයා උපයාගත් ධනය අහිමිකොටගෙන ඉණ ඇඳි වතට පමණක් සීමා වූයේ,

(1) කල්‍යාණ මිත්‍ර සේවනය නිසා ය.

(2) පරිත්‍යාගශීලීව මිල මුදල් වියදම් කළ නිසාය.

(3) සීලයේ පිහිටා කටයුතු නොකළ නිසා ය.

(4) සුදුසු වේලාවන්හි මං මාවත් වල සැරි සැරීම නිසාය.

20. යම් ක්‍රියාවකට නුවණැති අය නින්දා කරත් නම් එබඳු කුඩා වූ වරදකින් පවා වැළකීමට උත්සාහ කළ යුතු බව පෙන්වා දෙන සූත්‍ර දේශනාව නම්,

(1) කරණීයමෙත්ත සූත්‍රය.

(2) පරාභව සූත්‍රය.

(3) දම්සක් පැවතුම් සූත්‍රය

(4) සිගාලෝවාද සූත්‍රය.

21. බුදු දහම අනුව කායික මෙන්ම මානසික සෞඛ්‍යයෙන් ද පිරිහීමට හේතුවන්නේ,

(1) සුරාපානය කිරීම

(2) සොරකම් කිරීම

(3) සූදුවේ යෙදීම

(4) අලසකම

22. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන "සුගතියට මග පෙන්වීම" යන යුතුකම ඉටුකළ යුත්තේ,

(1) ගුරුවරු විසිනි.

(2) දෙමාපියන් විසිනි.

(3) පැවිදි පක්ෂය විසිනි

(4) ගිහි පක්ෂය විසිනි.

23. රාගාධී කෙලෙස් මලින් තොර වූ පිරිසිදු සිත් ඇත්තේ,

(1) දෙවියන්ට ය.

(2) ගාන්ධර්වයන්ට ය.

(3) බුද්ධාදී උතුමන්ට ය.

(4) මනුෂ්‍යයන්ට ය.

24. ගඟ පහළටම ඇදී යන්නේ ය. මිනිස්සු රාගයෙන් රාගයටම යති. ද්වේශයෙන් ද්වේශයටම යති. මෝහයෙන් මෝහයටම යති ........ මෙයින් කියවන්නේ ලෝකය,

(1) පටිසෝතගාමී බව ය.

(2) අනුසෝතගාමී බව ය.

(3) පරිණාමීය බව ය.

(4) අනන්ත බව ය.

25. බෞද්ධ ඉගැන්වීම් අනුව සාමය සමගිය සහජීවනය ඇති කර ගැනීම සඳහා අප කළ යුත්තේ,

(1) වෙනත් ආගමික ඉගැන්වීම් හෙලා දැකීම.

(2) තමන්ගේ ආගමේ කරුණු පමණක් හුවා දැක්වීම.

(3) අන් ආගමික මතවල අඩුපාඩු පෙන්වාදීම.

(4) ජාති, ආගම, කුලය වැනි කරුණු මුල් කර ගෙන එකිනෙකා දෙස වෛරයෙන් නොබැලීම.

26. සචේතනික ක්‍රියා සඳහා මූලික වන්නේ,

(1) සිත කය වචනයයි. (2) කුසලය හා අකුසලයයි.

(3) අභිධ්‍යාව හා ව්‍යාපාදයයි. (4) ලෝභ ද්වේශ හා මෝහයයි.

27. පඤ්ච ආනන්තරිය පාප කර්ම හා නියත මිත්‍යා දෘෂ්ටිය යන කර්ම අයත් වන්නේ,

(1) ගරුක අකුසල කර්ම වලටය. (2) ආසන්න කර්ම වලටය.

(3) ආචිණ්ණ කර්ම වලටය. (4) කටත්තා කර්ම වලටය.

28. ත්‍රිලක්ෂණය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) ත්‍රිලක්ෂණය ලොව සදාකාලිකව පවතින්නකි.

(2) සසර දුකින් එතෙරවීම තිලක්ෂණ අවබෝධය අනවශ්‍යයි.

(3) තිලක්ෂණය විශ්ව සාධාරණ ධර්මතාවයකි.

(4) දේශ කාල වශයෙන් ත්‍රිලක්ෂණය වෙනස් නොවේ.

29. "මම" හෙවත් "තමා" යන්නෙහි පාලි යෙදුම වන්නේ,

(1) ආත්ම යන්නයි (2) අත්ත යන්නයි

(3) අනාත්ම යන්න (4) දුක්ඛ යන්නයි

30. සැප දුක හා මැදිහත් වීදීම්, ඇස - කන ආදී ඉඳුරන්ට රූප ශබ්ද ආදි අරමුණු හමු වූ විට සිතෙහි ඇති වන වින්දනය නම්,

(1) රූප ස්කන්ධයයි (2) වේදනා ස්කන්ධය.

(3) සඤ්ඤා ස්කන්ධයයි. (4) සංඛාර ස්කන්ධයයි.

31. මහමෙවුනා උයනේ ඉදිවූ මහා විහාරය වඩාත් අංගසම්පූර්ණ ලෙස විවිධ ගොඩනැගිලි වලින් යුක්තව දැකුම්කළු සුවිසල් බෞද්ධ මධ්‍යස්ථානයක් බවට පත් කළේ,

(1) දේවානම්පියතිස්ස රජතුමාය. (2) මිහිඳු මහරහතන් වහන්සේය.

(3) දුටුගැමුණු රජතුමා ය. (4) ධර්මාශෝක රජතුමාය.

32. කීර්තිය හා අපකීර්තිය යන කරුණු දෙක,

(1) අරි අටගි මගට අයත් කරුණු දෙකකි. (2) සතර සංග්‍රහ වස්තු වලට අයත් කරුණු දෙකකි.

(3) භෝග විනාශයට හේතු දෙකකි. (4) අටලෝ දහමට අයත් කරුණු දෙකකි .

33. පැවිදි වීමට පෙර උපතිස්ස යනුවෙන් හැඳින්වුයේ,

(1) මුගලන් මහ රහතන් වහන්සේ ය. (2) සැරියුත් මහරහතන් වහන්සේ ය.

(3) ආනන්ද මහ රහතන් වහන්සේ ය. (4) සබ්බකාමී මහරහතන් වහන්සේ ය.

34. "ඉමස්මිං සති ඉදං හෝති" මෙහි සරල තේරුම වන්නේ,

(1) මෙය ඇති කල්හි මෙය වේ. (2) මෙය ඉපදීමෙන් මෙය උපදී.

(3) මෙය නැති කල්හි මෙය නොවේ. (4) මෙය නැති වී යෑමෙන් මෙය නැතිව යයි.

35. පටිච්ච සමුප්පාදය අනුව දුප්පත් අයට ධනය නොදීම නිසා දිළිඳුකම වැඩි වේ දිළිඳුකම වැඩි වීම නිසා සොරකම වැඩි වේ සොරකම වැඩි වීම නිසා,

(1) ජීවිත හානි වැඩි වේ. (2) අවි ආයුධ වැඩි වේ.

(3) මිල මුදල් වැඩි වේ. (4) දුප්පත්කම වැඩි වේ.

36. මිනිසා ඉදිරියේ ඇති මහා ප්‍රශ්නය සසර දුක ය. ඉන් මිදීම සඳහා බුදුදහම පෙන්වා දෙන්නේ,

(1) දුක්ඛ සත්‍යය පිළිබඳව තේරුම් ගැනීමයි.

(2) දුකට හේතු පිළිබඳ සොයා බැලීමයි.

(3) දුකට පත් අයට නිරතුරුවම පිහිට වීමයි.

(4) චතුරාර්ය සත්‍යය අවබෝධ කරගෙන සියලු කෙලෙස් නිවීමයි.

37. රූප,වේදනා,සංඥා, සංඛාර, විඥ්ඥාණ, යන කරුණු සිතින් දැඩිව අල්ලා ගැනීම,

(1) පංචස්කන්ධය නම් වේ. (2) වේදනා ස්කන්ධය නම් වේ.

(3) උපාදානය නම් වේ. (4) දුක්ඛ නම් වේ.

38. බුදු දහමේ මූලික ඉගැන්වීම් අතරට නොවැටෙන්නේ,

(1) කර්මය යි. (2) හේතුඵල දහම යි.

(3) චතුරාර්ය සත්‍යයයි. (4) පුනරුප්පත්තියයි.

39. බුදුරජාණන් වහන්සේ විසින් බරණැස ඉසිපතනාරාමයේ දී පස්වග භික්ෂූන් ට දේශනා කරන ලද්දේ

(1) දම්සක් පැවතුම් සූත්‍ර දේශනයයි.

(2) මහා පරිනිබ්බාණ සූත්‍ර දේශනයයි.

(3) අම්බට්ඨ සූත්‍ර දේශනයයි.

(4) මහා මොග්ගල්ලාන සූත්‍ර දේශනයයි.

40. ධර්ම විවරණ අනුව සසර දුක් තුන් ආකාරය වේ. දුක්ඛ දුක්ඛතා,විපරිණාම දුක්ඛතා ඉන් දෙකකි. අනෙක් දුක වන්නේ,

(1) විඥ්ඥාණ දුක්ඛතා.

(2) සංඥ්ඥා දුක්ඛතා.

(3) සංඛාර දුක්ඛතා.

(4) සංකීර්ණ දුක්ඛතා.

(ලකුණු 1 x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 10 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය

නම / විභාග අංකය :-.................................................................

II – කොටස

**පළමු** ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක්ද (02) සිට (06) දක්වා ප්‍රශ්නවල I කොටසට ලකුණු 2, II කොටසට ලකුණු 3, III කොටසට ලකුණු 05 ක් ද හිමි වේ.

1.
   i. පංච මහා විලෝකන නම් කරන්න.
   ii. සිදුහත් කුමරුට පිය රජතුමා සෘතු තුනට සාදා දුන් මාළිගා මොනවාද?
   iii. "රාහුලෝ ජාතෝ බන්ධනං ජාතං" මෙහි තේරුම ලියන්න.
   iv. කිසාගෝතමිය කියන ලද "මෙවන් පුතෙක් ලද මවක් පියෙක් නිවුණේ වෙති" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?
   v. "සන්දිට්ඨිකෝ ගුණය" හඳුන්වන්න.
   vi. භාවනාවේ ප්‍රභේද දෙක හඳුන්වන්න.
   vii. සිදුහත් බෝසතාණන් කිං කුසල ගවේසී ව සිටි අවධියේ උන්වහන්සේට හමුවූ ධ්‍යානලාභීන් දෙදෙනා නම් කරන්න.
   viii. ත්‍රිලක්ෂණය නම් කරන්න.
   ix. ධාර්මික ධනෝපායන මාර්ග දෙකක් නම් කරන්න.
   x. යේ ධම්මා හේතුප්පභවා ගාථාව සම්පූර්ණ කරන්න.

2.
   i. සිදුහත් කුමරුගේ උප්පත්තිය සමග සිදු වූ වැදගත් සිදුවීම් දෙකක් ලියන්න.
   ii. බෝසත් සිරිත අභියෝගවලින් පිරි පැවැතුනි. එම අභියෝග ජය ගැනීම සඳහා උන්වහන්සේ සතු ගුණාංග තුනක් ලියන්න.
   iii. පාසල් සිසුන් වශයෙන් ඔබට මුහුණ දීමට සිදුවන අභියෝග ජය ගන්නා ආකාරය බුදු සිරිත ඇසුරෙන් විස්තර කරන්න.

3.
   i. තෙරුවන් නම් කරන්න.
   ii. ශ්‍රද්ධාව හඳුන්වන්න.
   iii. පාසල් දරුවන් බුදු දහම අනුව රැකිය යුතු ප්‍රතිපත්ති විස්තර කරන්න.

4.
   i. භාවනාව යන්න හඳුන්වන්න.
   ii. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සීල ශික්ෂාව අයත් කරුණු මොනවාද?
   iii. භාවනා වැඩීමෙන් ලැබෙන ප්‍රයෝජන විස්තර කරන්න.

5.
   i. .........................................
      .........................................
      .........................................
      ඛීණ මච්චේව පල්ලලේ
      මෙම ධම්මපද ගාථාවේ හිස්තැනට යෙදෙන පද පේළි සම්පූර්ණ කරන්න.
   ii. ඉහත ගාථාවේ අදහස ලියන්න.
   iii. මහලු වියේ දී දුක් නොවීම සඳහා ජීවිතයේ බාල,තරුණ යන අවධි වල දී ක්‍රියා කළ යුතු ආකාරය විස්තර කරන්න.

6.

i. සිගාලෝවාද සූත්‍ර දේශනාව පරිදි දෙමාපියන් හා ගුරුවරුන් උපමා කර ඇති දිසා දෙක පිළිවෙළින් ලියන්න.
ii. දරුවන්ගෙන් දෙමාපියන්ට ඉටු විය යුතුකම් මොනවාද?
iii. දරුවන් විසින් දෙමාපියන්ට යුතුකම් ඉටු කරන ආකාරය විස්තර කරන්න.

7. මාතෘකා දෙකකට පමණක් පිළිතුරු ලියන්න.(එක් කොටසකට ලකුණු 05 ක් හිමි වේ.)

i. වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ හිමිපාණෝ
ii. භෝග විනාශයට හේතු (සිගාලෝවාද සූත්‍රය අනුව)
iii. ගති සම්පත්තිය
iv. පටිච්චසමුප්පාද න්‍යාය

Remove Watermark Now

| | | | |
|---|---|---|---|
| 1 - 3 | 11 - 3 | 21 - 1 | 31 - 3 |
| 2 - 2 | 12 - 3 | 22 - 3 | 32 - 4 |
| 3 - 3 | 13 - 3 | 23 - 3 | 33 - 2 |
| 4 - 3 | 14 - 3 | 24 - 2 | 34 - 1 |
| 5 - 2 | 15 - 1 | 25 - 4 | 35 - 2 |
| 6 - 3 | 16 - 4 | 26 - 1 | 36 - 4 |
| 7 - 2 | 17 - 3 | 27 - 1 | 37 - 3 |
| 8 - 3 | 18 - 4 | 28 - 2 | 38 - 4 |
| 9 - 4 | 19 - 3 | 29 - 2 | 39 - 1 |
| 10 - 4 | 20 - 1 | 30 - 2 | 40 - 3 |

## II - පත්‍රය

පළමු ප්‍රශ්නයේ එක් කොටසක් සඳහා ලකුණු 2 බැගින් 20 ක්ද, 02 සිට 06 දක්වා ප්‍රශ්නයක I කොටසට ලකුණු දෙකක්ද II කොටසට ලකුණු 03, III කොටසට ලකුණු පහක් ද හිමිවේ. 07 ප්‍රශ්නයේ කොටසකට ලකුණු 05 කි.

1.
   i. කාලය දීපය දේශය කුලය මව (කරුණු 02 - ලකුණු 1 කරුණු 02 කට වැඩිනම් ලකුණු 02 යි).
   ii. රම්‍ය, සුරම්‍ය, සුභ (කරුණු දෙකට ලකුණු 01 යි. කරුණු 2 ට වැඩි නම් ලකුණු 02.)
   iii. රාහුලයෙක් උපන්නා බැම්මක් ඇතිවුණි හෝ අදහසට ලකුණු ලබා දෙන්න.
   iv. සිදුහත් කුමරු තුළ ඇති තැන්පත් බව පිළිබඳව මෙම ප්‍රකාශයෙන් ප්‍රකට වේ.
   v. තමා විසින් ම පිළිපැද ඇස්පනාපිට මෙලොවදීම ප්‍රතිඵල දැකගත හැකි බැවින් ධර්මය සන්දිට්ඨික නම් වෙයි.
   vi. සමථ භාවනාව, විපස්සනා භාවනාව/ සමාධි භාවනාව, චිත්ත භාවනාව / ධ්‍යාන භාවනාව ප්‍රඥා භාවනාව හෝ උචිත පිළිතුරු කරුණු 01 ට ලකුණු 01 ක් දෙන්න. කරුණු 2 ට ලකුණු 02.
   vii. ආලාරකාලාම හා උද්දකරාමපුත්ත.
   viii. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම.
   ix. කෘෂිකර්මාන්තය, ගවපාලනය, දැහැමි වෙළඳාම, අවංක රාජ්‍ය සේවය, ශිල්ප කර්මාන්ත.
   x. යේ ධම්මා හේතුප්පභවා<br>තේසං හේතුං තථාගතෝ ආහ<br>තේසං ච යෝ නිරෝධෝ<br>ඒවං වාදී මහාසමණෝ

2.
   i. උපත සිදු වූ විගස පියවර තැබීම, බෝසත් සිරිපා පිළිගැනීමට සත්පියුම් පිපීම, සිංහනාද පැවැත්වීම.
   ii. ඉවසීම, කැපවීම, අධිෂ්ඨානය, විමසුම් නුවණ හෝ උචිත පිළිතුරු.
   iii. ශිෂ්‍ය ජීවිතය හා සම්බන්ධ ගැටලුවක් විසඳා ගන්නා ආකාරය බුදු සිරිත තුළ ඇති ගුණාංග ද උදාහරණයට. ගනිමින් ලියා ඇති පිළිතුරු වලට ලකුණු ලබා දෙන්න.

3.
   i. බුද්ධරත්නය, ධම්මරත්නය, සංඝරත්නය (කරුණු 02 - ලකුණු 1 කරුණු 02 කට වැඩිනම් ලකුණු 02 යි).
   ii. තෙරුවන් ගුණ දැන ඇතිකර ගන්නා පැහැදීම හෝ උචිත පිළිතුරු.
   iii. නිත්‍ය ශීලය, ආජීව අෂ්ටමග ශීලය, කුමර කුමරි බඹසර රැකීම, වැඩිහිටියන්ට කීකරුව, පාසලේ විනය ගරුකව හැසිරීම හෝ උචිත පිළිතුරු 03 විස්තර කර ඇත් නම් ලකුණු 05 දෙන්න.

4.
   i. කුසල් දහම් වැඩිදියුණු කරන මානසික අභ්‍යාසය භාවනාවයි හෝ ගැළපෙන පිළිතුරක්.
   ii. සම්මා වාචා සම්මා කම්මන්ත සම්මා ආජීව හෝ සිංහල අර්ථය.
   iii. සමථ විදර්ශනා වශයෙන් භාවනා වර්ග දෙකක් ඇති බවත් එම භාවනා වර්ග දෙක අනුව ලැබෙන ප්‍රතිඵල විස්තර කර ඇති පිළිතුරුවලට උපරිම ලකුණු ලබා දෙන්න.

Remove Watermark Now

5.

i. අචරිත්වා බ්‍රහ්ම චරියං
අලද්ධා යොබ්බනේ ධනං
ජිණ්ණ කොඤ්චාව ඣායන්ති
ඛීණ මච්චේව පල්ලලේ (අක්ෂර වින්‍යාසය නොසලකන්න).

ii. මෙලොව පරලොව සැපවත් බව මෙන්ම දුකින් මිදී නිවන් සුවයද උදා කරන උතුම් සීලාදී පිළිවෙත් හි ද නොයෙදී තරුණ වියේදී උපන් ධනය රැකගැනීමෙන් හා නූපන් ධනය ඉපදවීමෙන් ද තොරව ජීවත් වන්නේ, වැසි සමයෙහි මසුන් අල්ලා නොගෙන පසුව සිඳී ගිය පොකුණ දෙස බලා පසුතැවිලි වන මහලු කොස්වා ලිහිණියන්මෙන් පසුතැවෙන්නෝය.සුසුම් ලන්නෝය. මෙම අදහස සරලව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

iii. බාල අවධියේ දී - බ්‍රහ්ම චරියාවේ යෙදෙමින් නිසි පරිදි අධ්‍යාපනය ලැබිය යුතු බව
තරුණ අවධියේ දී - ප්‍රතිපත්ති ගරුකව ධාර්මිකව ධනය උපයා ගෙන නාස්ති නොකර ආරක්ෂා කර ගැනීම, යොවුන් මදයෙන් මත්ව තිදොරින් නරක දේ නොකර යහපත් ජීවිතයක් ගත කළ යුතුය. මෙසේ සිටියි නම් මහලු විය සතුටින් ගත කිරීමට අවස්ථාව ලැබේ.

6.

i. දෙමාපියන් - නැගෙනහිර (පුබ්බ දිසාව/පෙරදිග)
ගුරුවරු - දක්ඛිණ දිසාව (දකුණු දිග)

ii.

* මවුපියන් පෝෂණය කිරීම.
* මවුපියන්ගේ කටයුතු සොයාබලා ඉටුකර දිම.
* කුල පරපුර හා ඊට සම්බන්ධ චාරිත්‍ර ආරක්ෂා කර ගැනීම.
* දෙමාපියන්ගෙන් හිමි වූ දායාද රැක ගැනීම.
* මවුපියන් මිය පරලොව ගිය පසු පින් අනුමෝදන් කරවීම.

iii. ඉහත සඳහන් කළ කරුණු වලින් 03 ක් වත් නිදසුන් වශයෙන් ගෙන විස්තර සහිතව ලියා ඇති පිළිතුරු වලට ලකුණු 05 ක් ලබා දෙන්න.

7.

i. 06 පාඩම ඇසුරින් පිළිතුරු අගයන්න.
ii. 08 පාඩම - 46 පිටුව බලන්න.
iii. 12 පාඩම - 72 පිටුව බලන්න.
iv. 14 පාඩම ඇසුරින් පිළිතුරු අගයන්න.